# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT



මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026-01-22

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(iii)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැඟුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, 2025-12-05 දිනැති අයවැය චක්‍රලේඛ අංක 08/2025 සහ ඊට අදාලව නිකුත් කරන ලද සංශෝධිත චක්‍රලේඛ මඟින් යෝජිත සවිබල ගැන්වීමේ වැඩසටහන තුලින් ආපදාවෙන් බලපෑමට ලක්වූ ජනතාවගේ ජීවන තත්ත්වය වඩා ඵලදායී අයුරින් වැඩිදියුණු කිරීම සඳහා, ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති ව්‍යාපාර වෙත තවදුරටත් පුළුල්ව සහන සැලසීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, අංක 08/2025 අයවැය චක්‍රලේඛයෙහි වගුවේ අනු අංක 8 හි සඳහන් දීමනා ලබාදීම වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට පහත පරිදි පැහැදිලි කිරීම් හා සංශෝධන ඇතුළත් කරනු ලැබේ.

| අනු අංකය | | සහනය | දීමනාව |
|---|---|---|---|
| 8 | ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව | | |
| | 8.1 | කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 200,000/- |
| | 8.2 | ව්‍යාපාරයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 200,000/- |
| | 8.3 | ලියාපදිංචි නොවූ ගෘහස්ථව ස්ථිර ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන වෙළඳ ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 50,000/- |
| | 8.4 | ලියාපදිංචි නොවූ නිෂ්පාදන කර්මාන්ත හා හරිතාගාර යනාදිය සඳහා | ඒකකයකට රු. 50,000/- |
| | 8.5 | පදික සහ ජංගම ඇතුළු තාවකාලිකව සිදු කරන වෙළඳාම් සඳහා | ඒකකයකට රු. 25,000/- |

03. මෙහිදී, 8.1 හා 8.2 කාණ්ඩ යටතේ දක්වා ඇති **එක් ව්‍යාපාර ඒකකයක් සඳහා** ලබා ගත හැක්කේ එක් දීමනාවක් පමණි.

04. යම් **ප්‍රතිලාභියෙක්** ඉහත 8.3, 8.4 සහ 8.5 කාණ්ඩ යටතේ වන දීමනාවලින් කිහිපයක් සඳහා සුදුසුකම් ලබයි නම්, එහිදී හිමිගැන්විය යුත්තේ එම කාණ්ඩවලින් එක් කාණ්ඩයක් යටතේ වන දීමනාවක් පමණි. අවශ්‍ය ප්‍රතිපාදන වැය ශීර්ෂ අංක 103 යටතේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත සලසා දෙනු ලබන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවීම් සිදු කරනු ලැබේ.

05. අයවැය චක්‍රලේඛ අංක 08/2025 සහ 08/2025 (i) හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. විගණකාධිපති